(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 8(5).]

# පාර්ලිමේන්තුවේ අංක 8 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 මැයි මස 22 වැනි බදාදා**

## 2013 ජූනි මස 04 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ නියෝගය,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 10 වැනි සහ 25 වැනි වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 30 වැනි වගන්තිය යටතේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 පෙබරවාරි 15 දිනැති අංක 1797/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.05.22 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 ජූනි මස 07 වැනි සිකුරාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.181/’13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිය පුහුණු ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ අධිකරණයන්හි යුක්තිය පසිඳලීම සඳහා ප්‍රමුඛතම අවශ්‍යතාවයක් වන්නේ ගුණාත්මකභාවයෙන් ඉහළ විනිශ්චයකාර වෘත්තියක් ස්ථාපිත කිරීම බැවින්, ඒ සඳහා අත්‍යවශ්‍ය “ගුණාත්මකභාවයෙන් ඉතා ඉහළ” පුහුණුවක් ලබා දීම සඳහා දැනට පිහිටුවා ඇති “ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය” කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින්, විනිශ්චයකාරවරුන් පුහුණු කිරීමට විශ්වවිද්‍යාලයක ප්‍රමිතියට අනුකූලවූ විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිය පුහුණු ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.182/’13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ද්විතීයික පාසල් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොමිලයේ ලබාදීම,— ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසලකම ද්විතීයික අධ්‍යාපනය සහ සියලු රජයේ විශ්ව විද්‍යාලයන්හි සම්පූර්ණ අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා දිය යුතු බවත්, එකී අධ්‍යාපනය සම්පූර්ණ රජයේ වියදමෙන් ලබාදෙන නිදහස් අධ්‍යාපනයක් විය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.183/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මෝටර් වාහන හා සම්බන්ධ වන්දි නඩු සඳහා ලඝු කාර්ය පටිපාටියක් හඳුන්වාදීම,— මෝටර් වාහන හා සම්බන්ධ හදිසි අනතුරුවලින් මියගිය තැනැත්තන්ගේ උරුමකරුවන්ට සහ යැපෙන්නන්ට ද, එවැනි හදිසි අනතුරුවලින් තුවාල ලැබූ තැනැත්තන්ට ද වන්දි ලබාගැනීම සඳහා ඉතා අසීරු සහ දීර්ඝ අධිකරණ ක්‍රියාදාමයකට සහභාගීවීමට සිදුවීමෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වන බැවින්, මෝටර් වාහන හා සම්බන්ධ වන්දි නඩු සඳහා ලඝු කාර්ය පටිපාටියක් හඳුන්වා දෙන පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 186/'13

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්තිවල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම්වලට යොමු කෙරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.188/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව නගා සිටුවීම,— ඉහළ තලයේ කුසලතාවක්, කඩිසරභාවයක්, ශාරීරික යෝග්‍යතාවයක්, ක්ෂණික තීරණ ගැනීමක් සහ කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමක්, අවශ්‍ය කරන ප්‍රශස්ත ක්‍රීඩාවක් වන වොලිබෝල් ජාතික ක්‍රීඩාව නගා සිටුවීම සඳහා හොඳින් සැලසුම් කළ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.189/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— බීරළු නමින් හඳුන්වනු ලබන සම්ප්‍රදායික අත්‍යන්ත්‍ර රේන්ද කර්මාන්තය නගා සිටුවීම,— රේන්ද නිෂ්පාදනයේ නිරත ග්‍රාමීය ජනතාවට ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකියාව සලසා දීම සඳහා ඔවුන්ට නවීන පහසුකම් දෙමින් බීරළු ගෘහස්ත කර්මාන්තය වැඩි දියුණු කිරීමට සහ රේන්ද සහ රේන්ද නිෂ්පාදන සංචාරකයන් අතර ජනප්‍රිය කරවීමට ඵලදායී සහ අර්ථවත් පියවර ගත යුතුයැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2013 ජූනි මස 18 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2454/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඹුරුගමුව, මැදගොඩ රජයේ හෙදි පුහුණු විද්‍යාලයක් ඇති බවත්;

(ii) එම හෙදි පුහුණු විද්‍යාලයේ සිසුන් සහ ගුරු මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහ නේවාසිකාගාර පහසුකම් නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් එම විද්‍යාලයට බඳවාගන්නා ලද සිසුවියන්ගෙන් කොටසක් ශ්‍රී ජයවර්ධනපුර හෙදි විද්‍යාලය වෙත මාරු කර යවන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් හෙදි විද්‍යාලය වසා දැමීමේ සූදානමක් තිබේද;

(ii) එසේ නොමැති නම්, එම විදුහල වෙනත් ස්ථානයකට ගෙනයාමේ සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, එම විදුහල ගෙනයෑමට නියමිත ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2798/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ඇති රක්ෂිත වනාන්තරවල නම් කවරේද;

(ii) 2005 වර්ෂයේදී සහ 2012 වර්ෂයේදී එම එක් එක් වන රක්ෂිතයට අයත් වූ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වන රක්ෂිතවලට අයත් වූ භූමි ප්‍රමාණයන් අඩු වී තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට වන රක්ෂිතවලට අයත් ඉඩම්වල අනවසර පදිංචිකරුවන් සිටී නම්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) රක්ෂිතවලට අයත් ඉඩම් කොටස් නීත්‍යානුකූල ලෙස ලබා දී තිබේ නම්, එම ඉඩම් ලබාගත් පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එකී ඉඩම් ලබාදුන් බලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කාල සීමාවේදී වන රක්ෂිතවලට හානි කළ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඔවුන් සිදුකළ හානි කවරේද;

(iii) එම තැනැත්තන්ට එරෙහිව ගත් පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2972/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වැන්දඹු හා අනත්දරු දායක මුදල් ගෙවා ගැනීමට නොහැකි තරමටම මධ්‍යම පළාත් සභාව දරුණු මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇති බවත්;

(ii) වැන්දඹු හා අනත්දරු දායක මුදල් එම පළාත් සභාවේ සේවකයින්ගේ වැටුපෙන් අඩු කරනු ලැබුවද, එම මුදල් සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ගිණුම්වලට බැර කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මධ්‍යම පළාත් සභාව විසින් බැර කිරීමට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට සේවකයින්ගේ වැටුප්වලින් වැන්දඹු හා අනත්දරු දායක මුදල් ලෙස අඩු කරගෙන ඇති මුදල කොපමණද;

(iii) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබූ මුදල් එම ගිණුම්වලට බැර කිරීමට නොහැකිවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මධ්‍යම පළාත් සභා සේවකයින්ගේ දායක මුදල් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුම්වලට බැර කිරීමට කටයුතු කිරීමටත්;

(ii) මෙම පළාත් සභාවෙහි පවතින මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3205/'12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පූර්ව ළමාවිය සංවර්ධන වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවය කරන පෙර පාසල් පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) එම පාලිකාවන් රජයේ ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත පෙර පාසල් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලිවල තත්ත්වය කවරේද;

(ii) ස්ථිර ගොඩනැගිලි නොමැති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) විදුලිබල පහසුකම් ලබා දී ඇති පෙර පාසල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පෙර පාසල් සඳහා කිසියම් දීමනාවක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එහි වටිනාකම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) විදුලිය, වැසිකිළි සහ ගොඩනැගිලි පහසුකම් නොමැති පෙර පාසල්වලට එම පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) උතුරු මැද පළාත් සභාව මගින් පෙර පාසල් සඳහා ලබාදෙන පහසුකම් කවරේද;

යන්නත් එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3209/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 මැයි 01 ලෝක කම්කරු දිනයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංගම විශ්‍රාමික සේවකයින් සුළු පිරිසකට පමණක් සංකේතාත්මකව හිඟ පාරිතෝෂික ගෙවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) 1978-1991 වකවානුව තුළ සේවය කොට විශ්‍රාම ලැබූ ශ්‍රී ලංගම සේවකයින්ගෙන්,

(i) සම්පූර්ණ විශ්‍රාම පාරිතෝෂිකය ලබාගෙන ඇති සංඛ්‍යාව;

(ii) විශ්‍රාම පාරිතෝෂිකයෙන් කොටසක් පමණක් ලබාගෙන ඇති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ශ්‍රී ලංගම සේවකයින්ගේ හිඟ විශ්‍රාම පාරිතෝෂිකය නොපමාව ලබා දෙන ලෙසට නඩු තීන්දුව ලබාදී මේ වනවිට ගතවී ඇති කාලය කොපමණද;

(ii) ශ්‍රී ලංගම විශ්‍රාමිකයින්ගේ හිඟ විශ්‍රාම පාරිතෝෂික කඩිනමින් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3287/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් නගරයේ තැපැල් කාර්යාලයක් නොමැති නිසා එම ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(ii) හිදායාපුරම්හි, පොතුවිල් මධ්‍ය මහා විද්‍යාල පාරේ ක්‍රියාත්මක වූ උප තැපැල් කාර්යාලය වසා දැමීම හේතුවෙන් ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) පොදු ජනතාව මුහුණ දෙන මෙම දුෂ්කරතාවයන් පිළිබඳව සලකා බලා පොතුවිල් නගරයේ උප තැපැල් කාර්යාලයක් පිහිටුවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3043/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශාල පිරිවැයක් දරා අදියර 2ක් යටතේ සවිකළ මහනුවර නගරයේ වර්ණ සංඥා පද්ධති වර්ෂ 14 ක කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වර්ණ සංඥා පද්ධතිය සවිකිරීමේ පළමුවැනි හා දෙවැනි අදියරයන්වලදී ස්ථාපනය කළ වර්ණ සංඥා පද්ධති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද:

(ii) එම පළමුවැනි හා දෙවැනි අදියරයන් ක්‍රියාත්මක කළ වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මහනුවර නගරයෙහි පවතින වාහන තදබදයට පිළියමක් ලෙස සවිකළ ඉහත සඳහන් වර්ණ සංඥා පද්ධති ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක් තුළ ඊට විකල්ප ක්‍රියාමාර්ගයක් සැලසුම් කර තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 ජූනි මස 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2519/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලේවත්ත ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ආයතනය තුළ මූල්‍ය වංචා සිදු කිරීම සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන අංශය මගින් විමර්ශනයක් පැවැත්වූ බවත්;

(ii) එම විමර්ශන කටයුතුවලදී ඔහුගේ මූල්‍ය වංචා තහවුරු වූ බවට ජනාධිපති ලේකම්තුමාට ලිඛිතව දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මූල්‍ය වංචා සම්බන්ධයෙන් චෝදනා ලැබූවෙකු තවදුරටත් ඉහත සඳහන් ආයතනයේ සේවයේ තබා ගැනීම මුළු මහත් රාජ්‍ය සේවයම පරිහානියට පත් කිරීමට හේතුවක් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඔහු සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2565/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංචාරක පුරවරයක් වන අලුත්ගම නගරයේ පුළුල් මාර්ග පද්ධතියට සරිලන පරිදි ක්‍රමවත්ව සකසා නොමැති කාණු පද්ධතියේ අපද්‍රව්‍ය රැඳී අවහිරවීම නගරය පුරා දුර්ගන්ධයක් පැතිරයාමට හේතුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනු ලබන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) අලුත්ගම නගරයේ ඉදිකළ නව බස් නැවතුම්පළෙහි කඩ සාප්පු මේ වනතෙක් වෙළෙඳුන්ට ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2801/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මැදහත්වීමෙන් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පලතුරු අපනයන ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් සපයාගත් ආකාරය කවරේද;

(iv) ඒ යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂයේ සිට මේ දක්වා එක් එක් පලතුරු වර්ගයේ වාර්ෂික නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම නිෂ්පාදන අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(vii) එකී රටවල් වෙත වාර්ෂිකව අපනයනය කරනු ලැබූ පලතුරු වර්ග සහ ඒවායේ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) මේ වනවිට එම ව්‍යාපෘතිය ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2818/’12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනයට අදාළව,

(i) මාසික සහ වාර්ෂික නඩත්තු පිරිවැය සහ පොලී පිරිවැය කොපමණද;

(ii) ණය ගැනුම්වල ප්‍රාග්ධන පිරිවැය කොපමණද;

(iii) අපේක්ෂිත මාසික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගන ව්‍යාපෘතියේ ණය ආපසු ගෙවීමේ කාල සීමාව කොපමණද;

(ii) මෙම කාල සීමාව සඳහා මුදල් හිඟය කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතියේ සියලු ණය හිමියන් සඳහා මේ වන විට මුදල් ගෙවනු ලබන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3044/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කළුතර දිස්ත්‍රික්කයේ මතුගම, අගලවත්ත සහ බුලත්සිංහල යන ප්‍රදේශවල පෞද්ගලීකකරණය කළ රාජ්‍ය අංශයේ වතුවල කම්කරු ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කළ මුදල් එම වතු සමාගම් විසින් කපාහැර ඇති බැවින් එම කම්කරු ජනතාව දැඩි සෞඛ්‍යමය ගැටලුවලට මුහුණ පා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රදේශවල ජීවත් වන වතු කම්කරු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතු කම්කරු ජනතාවට ලබා දී ඇති සෞඛ්‍ය පහසුකම් කවරේද;

(iii) එම වතු කම්කරු ප්‍රජාව තුළ මේ වන විට පවතින ළමා හා මාතෘ මරණ, බෝනොවන රෝග වැළඳීම්, අනිසි ගැබ් ගැනීම් සහ මන්දපෝෂණයට අදාළ සංඛ්‍යාත්මක දත්ත කවරේද;

(iv) එම ප්‍රදේශවලට අවශ්‍ය සනීපාරක්ෂක හා සෞඛ්‍ය පහසුකම් කඩිනමින් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3051/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිවයින පුරා රෝහල්වල වෛද්‍ය පර්යේෂණාගාර තාක්ෂණ විද්‍යාඥයන්ගේ දැඩි හිඟයක් පවතින අවස්ථාවක, එම තනතුර සඳහා පත්වීම් ලැබූ නිලධාරීන්ගේ අදාළ පත්වීම් ස්ථාන දෙපාර්තමේන්තු බලධාරීන් විසින් සංශෝධනය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය තුළ වෛද්‍ය පර්යේෂණාගාර තාක්‍ෂණ විද්‍යාඥයින් ලෙස පත්වීම් ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) පත්වීම් ලබාදීමෙන් අනතුරුව එම නිලධාරීන්ගේ පත්වීම් ස්ථාන සංශෝධනය කිරීමට හේතු කවරේද;

(iii) පත්වීම් ස්ථානවලට අදාළ සංශෝධනයන් ඉවත් කිරීමට වහාම පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3052/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ රටවලින් මෙරටට අවශ්‍ය ඖෂධ වර්ග 7500 පමණ ප්‍රමාණයක් ආනයනය කෙරෙන බවත්;

(ii) එම ඖෂධ ගෙන්වන ව්‍යාපාරිකයන් එම ඖෂධවලින් 800% දක්වා ලාභ ලබන බවත්;

(iii) මේ හේතුවෙන්, රෝගීන් දැඩි අපහසුතාවයට ලක්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදේශ රටවලින් මෙරටට ආනයනය කරනු ලබන ඖෂධ වර්ග කවරේද;

(ii) ඖෂධවලට පාලන මිලක් පැනවීමට සැකසූ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඖෂධ වෙළඳාමෙන් අයුතු ලෙස ලාභ ලබන ව්‍යාපාරිකයන්ට එරෙහිව පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2569/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ දී අතිවිශේෂ ගැසට් නිවේදනයකින් රක්ෂිත ප්‍රදේශයක් බවට ප්‍රකාශිත බුලත්සිංහල, වගුරාන වනාන්තරය විනාශයට පත්වෙමින් පවතින බවත්;

(ii) ඉතා දුර්ලභ ශාක හා සත්ව සම්පත්වලින් අනූන මෙම වනාන්තරය රැක ගැනීමට ආරක්‍ෂක නිලධාරීන් යොදවා නොමැති බවත්;

(iii) එම වනාන්තරය නැරඹීමට එන අය සඳහා තොරතුරු සැපයීමේ වැඩපිළිවෙළක් නොමැති බවත්;

(iv) බටපොත ඇල ඔස්සේ වගුරාන වනාන්තරයට කැළි කසළ ගලා ඒම වැළැක්වීමට වැඩපිළිවෙළක් සලසා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් සංවේදී පරිසර කලාපයට ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ සේවය කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2702/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පිරිවෙන්වල අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේලා දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ සිය අධ්‍යාපන කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට පිරිවෙන්වල අධ්‍යාපනය ලබන එක් ගිහි හෝ පැවිදි ශිෂ්‍යයෙකු සඳහා වාර්ෂිකව ලබාදෙන ආධාර මුදල කොපමණද;

(ii) එම මුදල වර්තමාන ආර්ථික තත්ත්වය හා සැසඳීමේදී ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iii) එම මුදල වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, වැඩිකරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2804/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) (i) හම්බන්තොට බීච් වොලිබෝල් තරගාවලිය පැවැත් වූ දිනයන් කවරේද;

(ii) ඒ සඳහා රජය වැයකළ මුදල කොපමණද;

(iii) එම මුදල් වැයකළ ආකාරය කෙසේද;

(iv) එම තරඟමාලාව සංවිධානය කළ අය කවුරුන්ද;

(v) ඊට සහභාගි වූ රටවල් කවරේද;

(vi) ඒ සඳහා සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව කොපමණද;

(vii) එහිදී ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලැබූ ජයග්‍රහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2824/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිසි ක්‍රියාපිළිවෙත අනුගමනය කිරීමකින් තොරව ත්‍රිවිධ හමුදා හැරගිය පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් හමුදාව හැර යාමට හේතු වූ කරුණු කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(iv) එවැනි සේවය හැර යෑම් යළි ඇති නොවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී ත්‍රිවිධ හමුදාව සඳහා වැය වූ මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3053/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලිගම කනිෂ්ඨ විදුහලේ මේ වන විට ඉගෙනුම ලබන සිසුන් 249 ට ඉගැන්වීම සඳහා සිටින්නේ ගුරුවරුන් තිදෙනෙක් පමණක් බවත්;

(ii) එම විදුහල තුළ තවත් අඩුපාඩු රැසක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විදුහලේ පවත්නා ගුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙතෙක් පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් අයදුම්පත්‍ර කැඳවීමක් කොට අදාළ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එම විදුහලේ පවතින අඩුපාඩු නිසා සිසුන්ට මුහුණදීමට සිදුවී ඇති දැඩි දුෂ්කරතා පිළිබඳව සොයා බලා එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3253/'12

ගරු පී. හැරිසන් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 නොවැම්බර් මස 09 වැනි දින වැලිකඩ බන්ධනාගාරයේ ඇතිවූ ගැටුමට මුල් වූ හේතුව කුමක්ද;

(ii) එදින බන්ධනාගාරය පරීක්ෂා කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය යෙදුවේ බන්ධනාගාර නිලධාරීන්ගේ සෝදිසි කිරීම් ප්‍රමාණවත් නොවූ නිසාද;

(iii) ඒ සඳහා එම බලකාය යෙදවීමට නියෝග ලබා දුන් අය කවුරුන්ද;

(iv) බන්ධනාගාර පරීක්ෂාවට සහභාගීවූ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් බන්ධනාගාරය තුළට ආයුධ සන්නද්ධව ඇතුල් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ගැටුමේදී,

(i) රැඳවියන්හට අවි ගබඩාවට ඇතුලුවී අවි ලබා ගැනීමට බන්ධනාගාර නිලධාරීන්ගෙන් සහය ලැබුණු බවත්;

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරියෙකුගේ පෞද්ගලික අවශ්‍යතාව මත රැඳවියන්ට වෙඩි තැබීම සිදුවී ඇති බවත්;

(iii) බන්ධනාගාර රැඳවියන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) බන්ධනාගාර අවි ගබඩාවෙන් අවි ලබා ගැනීමට රැඳවියන්ට සහයෝගය ලබාදී ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) මියගිය රැඳවියන් වෙනුවෙන් රජය වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරන්නේද;

(iii) මෙවැනි සිද්ධීන් නැවත ඇති නොවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3054/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජය යටතේ ඇති රෝහල් 50ක පිරිසිදු කිරීමේ කටයුතු පිටස්තර ආයතන මගින් සිදුකර ගැනීම සඳහා වර්ෂයකට රුපියල් මිලියන 300ක පමණ මුදලක් වැය කරන බවත්;

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් පිරිසක් ගාල්ල, කරාපිටිය රෝහලේ පිරිසිදු කිරීම් සම්බන්ධ ටෙන්ඩරය ලබාදීම ජාවාරමක් ලෙස සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට කරාපිටිය රෝහලේ පිරිසිදුකිරීමේ ටෙන්ඩරය ලබා දී ඇති සමාගම කවරේද;

(ii) එම ටෙන්ඩරය අනුව ඉහත සමාගම විසින් එකී රෝහලේ පිරිසිදුකිරීම් කටයුතුවලට යොදවා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සමාගම විසින් එම රෝහලේ පිරිසිදුකිරීම් කටයුතු නිසියාකාරව ඉටු නොකරන තත්ත්වයක් යටතේ වුවද සෑම වර්ෂයකම අදාළ ටෙන්ඩරය එම ආයතනයටම ලබාදීමට හේතු කවරේද;

(iv) එම ටෙන්ඩරය ලබාදීමේදී වංචා සහගත ලෙස කටයුතු කරන බලධාරීන්ට එරෙහිව පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2523/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් විමර්ශන නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) 2010 මැයි සිට මේ දක්වා එම ආයතනයට පත්කළ එක් එක් විමර්ශන නිලධාරීයාගේ නම, ලිපිනය, පත්කළ දිනය, උපන් දිනය, පත්කළ දිනට වයස සහ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් පත්කිරීමේදී ප්‍රසිද්ධ දැන්වීමක් මගින් කැඳවූ අයදුම්පත් සලකා බැලුවේද;

(iv) නොඑසේ නම්, එම පත්කිරීම් සිදුකළ ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පත්කළ දින සිට 2012 පෙබරවාරි 29 දින දක්වා කාලය තුළදී,

(i) එක් එක් මාසයේදී විමර්ශන නිලධාරීන්ට ගෙවූ වැටුප් හා දීමනා, ගමන් වියදම් හා සංයුක්ත දීමනා, ආහාර, ප්‍රසාද සහ වෙනත් දීමනා එක් එක් නිලධාරියා අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරීන් විසින් ඉදිරිපත් කළ සියලුම විමර්ශන වාර්තාවල සහතික පිටපත් ඉදිරිපත් කරන්නේද;

(iii) විමර්ශන නිලධාරීන් සේවයෙන් ඉවත්කර තිබේද;

(iv) ඉවත්කළ අයගේ නම්, ඉවත්කළ දිනය හා ඉවත්කිරීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2574/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතීන් සුරක්‍ෂා කරන කාන්තා ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත්කර තිබේද;

(ii) කාන්තාවන්ගේ අයිතීන් සුරක්‍ෂා කිරීම උදෙසා මෙම ප්‍රඥප්තියේ අඩංගු මූලික ගුණාංගයන් කවරේද;

(iii) ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තියට නීතිමය බලයක් ලබාදීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2805/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරායේ පිවිසුමට අවහිර වී තිබූ කළුගලේ වර්ග අඩි ප්‍රමාණය කොපමණද;

(ii) එම කළුගල ඉවත් කිරීම සඳහා වූ ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) මේ වන විට එකී ගල සම්පූර්ණයෙන් ම කඩා ඉවත් කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය වූ සමස්ත මුදල හා එම මුදල සපයා ගත් ආකාරය කවරේද;

(v) කළුගල ඉවත් කිරීමේ කටයුතු භාරව ක්‍රියා කළ සමාගමේ නම කවරේද;

(vi) එම සමාගම අයත් රට කවරේද;

(vii) භාණ්ඩ ප්‍රවාහන නෞකා හම්බන්තොට වරායට ඇතුල්කිරීමට අවහිරතා ඇතිකරන වෙනත් බාධක තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2827/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සේවයේ යෙදීමට අවසර ලබාදී ඇති ඉන්දියානු ජාතික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන්දියානු ජාතිකයන්ගේ වීසා අවශ්‍යතාවන්හි මෙතරම් විශාල වැඩිවීමක් ඇතිවීමට හේතුව කුමක්ද;

(iii) මෙරටට පැමිණීමේදී ඉන්දියානු ජාතිකයන්හට ලබාදෙන වීසා සඳහා ගාස්තුවක් අය කිරීමට හේතුව කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ රැකියාවල නිරතවීමට ශ්‍රමිකයන් 500ට වඩා වැඩි පිරිසකට අවසර දී ඇති වෙනත් රටවල් තිබේද;

(ii) එම විදේශිකයන්ට මෙරට රැකියාවල නිරත වීමට ඉඩ ලබාදීමෙන් ශ්‍රී ලංකාව ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3055/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් රෝගීන්ට අතුරු ආබාධ ඇති විය හැකි ලිග්නොකේන් හයිඩ්‍රොක්ලෝරයිඩ් නමැති ජෙල් වර්ගය 2012 අප්‍රේල් 09 දින සිට භාවිතයෙන් ඉවත් කරන ලෙස උපදෙස් දී තිබුණද තවමත් ඇතැම් රෝහල්වල එම ජෙල් වර්ගය රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජෙල් වර්ගය භාවිතයෙන් ඉවත් කිරීම සඳහා සාර්ථක වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේද;

(ii) මේ වන විටත් එම ජෙල් වර්ගය භාවිතා කරන රෝහල් පිළිබඳව සොයා බලා ඒවා භාවිතයෙන් ඉවත් කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් දෙනු ලබන්නේද;

(iii) එම ජෙල් වර්ගය වෙනුවට ස්ථානීය නිර්වින්දනය සඳහා රෝගීන්ට හිතකර වෙනත් ජෙල් වර්ගයක් ආනයනය කරනු නොලබන්නේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3056/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 5ක කාලපරිච්ඡේදයේදී සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රමිතියෙන් තොර ඖෂධ ආනයනය කිරීම, ඖෂධ නිසි ලෙස ගබඩා නොකිරීම, ඖෂධ අයථා පරිදි සඟවා තබා ගැනීම, කල් ඉකුත්වූ ඖෂධ හා වෛද්‍ය උපකරණ නැවත භාවිතයට ගැනීම, ලියාපදිංචි නොකළ ඖෂධ ආනයනය කිරීම යනාදී විවිධ අක්‍රමිකතා, දූෂණ හා වංචා විශාල සංඛ්‍යාවක් සිදුවී ඇති බවත්;

(ii) ඒවා සම්බන්ධයෙන් අදාළ බලධාරීන් මේ වනවිටත් නිහඬ පිළිවෙතක් අනුගමනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ සිදුවී ඇති අක්‍රමිකතා, දූෂණ හා වංචාවන් පිළිබඳ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) එම දූෂණ, වංචා සහ අක්‍රමිකතාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) රෝගී ජනතාවගේ ජීවිත අවදානමට ලක් කරමින් සිදුවන ඉහත සඳහන් ආකාරයේ අක්‍රමිකතා පිළිබඳව මෙතෙක් නිසි අවධානය යොමු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3060/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වන සත්වයන් හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත සම්මත කරන ලද නමුත්, මේ වන විට විවිධ දේශපාලනඥයන්ගේ සහ ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා එහි ඇතැම් වගන්ති සංශෝධනයකට ලක්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි මේ වනවිට වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ සංශෝධනයට ලක්වී ඇති වගන්ති කවරේද;

(ii) එම වගන්ති සංශෝධනය කිරීමෙන් පසු සම්මත කිරීමට බලාපොරොත්තු වන්නා වූ නව පනත් කවරේද;

(iii) එම ආඥාපනතට ඉහත (අ) හි සඳහන් පරිදි සංශෝධන ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පෙරදැරි කොටගෙන කටයුතු කළ අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?